**තණමල්විල ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තණමල්විල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට තණමල්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්  ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,  ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ)  (iii) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සභාව විසින් තොග අගය කිරීම, ආදායම් හඳුනා ගැනීම සහ කෙරීගෙන යන වැඩ ගිණුම්ගත කිරීමට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී හා පෙර වර්ෂවලදී ප්‍රාදේශීය සභාවට අයත් නව ගොඩනැගිලි ඉදිකිරීම සහ වැඩි දියුණු කිරීම් 20 ක් සඳහා දරන ලද එකතුව රු.32,837,050 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඉඩම් හා ගොඩනැගිලි යටතේ අදාළ වටිනාකම් ඇතුළත් කරන බව දන්වා සිටිමි. | ප්‍රාදේශීය සභාව ප්‍රයෝජනයට ගන්නා සියලුම දේපල පිරියත උපකරණවල වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සභාව සතු වාහන රක්ෂණය කිරීම හා ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා 2023 වර්ෂය වෙනුවෙන් කරන ලද පෙර ගෙවුම් රු. 98,724 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.197,447 ක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියට කළ ගෙවීම් දෙවරක් සටහන් වීම 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය රු.1,780,982,520 ක් වුවද, ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක ගිණුමේ ශේෂය රු.1,780,561,514 ක් විය. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ සභාව විසින් අත්පත් කරගෙන තිබුණු රු. 1,346,795 ක වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි වටිනාකම ප්‍රාග්ධනිත කරන බව දන්වා සිටිමි. | නිවැරදි ශේෂ ගිණුම්වල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් තුළ විවිධ තැන්පත් ලෙස රු.18,656,693 ක් දක්වා තිබුණද, විවිධ තැන්පත් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවිය යුතුව පවතින ශේෂය රු. 11,592,732 ක් විය. | තවදුරටත් තැන්පත් ලේඛනය පරීක්ෂා කර මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඊ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් එකතුව රු.16,000,000 ක් වූ දේපල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ඇතුලත්ව නොතිබුණි. | මෙම වත්කම් වටිනාකම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ප්‍රාදේශීය සභාව ප්‍රයෝජනයට ගන්නා සියලුම දේපල පිරියත උපකරණවල වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 10 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් හා ඒ සඳහා ලබාදී ඇති උපලේඛන හා ලේඛනවල දක්වා ඇති ශේෂයන් අතර එකතුව රු.14,909,777 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාළ උප ලේඛන හා ලේඛන තවදුරටත් පරීක්ෂාකර මෙම වරද කඩිනමින් නිවැරදි කරන බව දන්වා සිටිමි. | ලේඛන හා උපලේඛන යාවත්කාලීන කර නොසැසඳීම් වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |
| (ආ) | නියැදි පරීක්ෂාවට අනුව ගිණුම් විෂයයන් 06 කට අදාලව ලේඛන අනුව පැවති වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හෝ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය සමඟ සංසන්දනය කිරීමේදී රු .43,502,452 ක වෙනසක් විය. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 1,771,061,030 ක් වූ වත්කම් විෂයයන් 05 ක් හා වගකීම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන, වෘත්තීය තක්සේරුකරුවන්ගේ වාර්තා, සියලු වත්කම් සහිත උපලේඛන, යාවත්කාලීන කරන ලද හිඟ බදු ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී සභාවේ මූල්‍ය තත්ත්වය මත මැනුම් කටයුතු සිදු කර වෘත්තිය තක්සේරුවක් සිදු කරන බවත් ස්ථාවර වත්කම් ලේඛනය සහ අදාල අනෙකුත් ලේඛන යාවත්කාලීන කරන බවත් දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 | වසර 02 ක ඉක්මවන ලද රු.3,000,595 ක තැන්පතු ශේෂ නියාදනය කර නොතිබුණි. | වසර 02 ඉක්මවන ලද තැන්පතු ශේෂ නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම්ගේ 2015 මාර්තු 10 දිනැති අංක 3/2014(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | තණමල්විල ප්‍රාදේශීය සභාවේ සේවය කරන ලද වැඩ බලන සභා ලේකම්වරයකුට චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි 2015 දෙසැම්බර් සිට 2019 ඔක්තෝබර් දක්වා මාසයකට රු. 4,000 බැගින් රු.94,000ක දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. | මෙම නිලධාරී මහතා විශ්‍රාම ගොස් ඇති අතර වැඩිපුර ගෙවන ලද දුරකථන දීමනාව අයකර දෙන මෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂතුමාගෙන් ඉල්ලීමක් කර ඇත. | වැඩිපුර ගෙවීම් අයකළ යුතුය. |
| (ඇ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | සභාව විසින් නඩත්තු කරනු ලබන වීථි පහන් සංඛ්‍යාව, ඒවා පිහිටි ස්ථානය ආදිය හඳුනා ගැනීමට හැකිවන පරිදි වීථි පහන් සංගණනයක් සිදුකර නොතිබුණු අතර වීථි පහන් ආලෝකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි. | වීථි ලාම්පු සංගණනය ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ආරම්භ කර ඇති බවත් විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම් ගතවීම සඳහා අදාල ආයතන සමඟ සාකච්ඡා සිදුකළ බවත් කාරුණිකව දන්වමි. | වීථි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර චක්‍රලේඛය පරිදි ගිවිසුම්ගත විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,360,922 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 24,094,688 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 50,000 | 162,500 | 162,500 | - | 50,000 | - | - | - |
| (ii) | කුලී | 13,190,170 | 8,102,426 | 6,586,576 | 1,515,850 | 15,795,500 | 12,039,132 | 5,649,939 | 6,389,193 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,235,465 | 1,390,595 | 1,390,595 | - | 2,048,530 | 1,460,602 | 1,460,602 | - |
| (iv) | වෙනත් ආදායම් | 58,270,788 | 2,274,129 | 2,231,479 | 42,650 | 58,854,279 | 9,952,425 | 8,425,875 | 1,526,550 |
| | **එකතුව** | 72,746,423 | 11,929,650 | 10,371,150 | 1,558,500 | 76,748,309 | 23,452,159 | 15,536,416 | 7,915,743 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.11,929,650 ක් වූ මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන විට රු.1,558,500 ක් අයකරගෙන නොතිබුණු අතර එය මුළු බිල්කළ ආදායමෙන් සියයට 13 ක් විය. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ආ) | සභාව සතු සතිපොළ 03 ක් බදුදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.4,561,500 ක් වූ ටෙන්ඩර් දේපල බදු ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු. 813,760 ක් අයකරගත යුතුව පැවතුණි. | මෙම හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ බදු මුදල් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ බදු දී තිබුණු කඩ කාමර 107 කින් අයවිය යුතු රු.1,735,900 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.366,295 ක් අයකරගත යුතුව පැවතුණි. එය මුළු බිල්කළ ආදායමින් සියයට 21ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ කඩ කාමර කුලී මුදල් අයකරගත යුතුය. |
| (ඈ) | ප්‍රාදේශීය සභාවට අයත් ජල ව්‍යාපෘති 02 ක ජල පාරිභෝගිකයන් 519 කගෙන් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු රු.1,385,503 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ජල ගාස්තු අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.5,232,127 ක් සහ මුද්දර ගාස්තු රු.1,963,765 ක් ගෙන්වාගෙන නොතිබුණි. | මේ වන විට උසාවි දඩ රු.3,403,877 ක් අයකරගෙන ඇති අතර මුද්දර ගාස්තු හිඟය ලබාගැනීම සඳහා වන ඉල්ලීම අදාල බලධාරීන් වෙත සිදු කළද මේවන තෙක් හිඟ මුදල් ලබාදී නැත. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වාගත යුතුය. |
| (ඊ) | සභාව විසින් යන්ත්‍ර කුලියට දීම වෙනුවෙන් 2014 සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු. 2,751,968 ක හිඟ යන්ත්‍ර කුලී ආදායම් 2023 මාර්තු 17 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ අයකර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගන්නා බව දන්වමි. | හිඟ යන්ත්‍ර කුලී ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සභාවට අයත් බදු දේපල 9 කින් 2022 ඔක්තෝබර් 31 දිනට අයවිය යුතු රු.13,115,888 ක හිඟ බදු කුලී අයකරගෙන නොතිබුණි. | මේ වන විට සභාවට අයවිය යුතු හිඟ මුදල රු. 303,625 ක් වේ. | හිඟ ආදායම් අයකරගත යුතුය. |

**2.3** අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවල දී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.76,608 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | 2023 අප්‍රේල් 28 දින වන විට තව දුරටත් රු.70,608.20 ක් ගෙවීමට ඇත. එම මුදල මාසිකව අයවීමට නියමිතය. | හිඟ අධිභාර අයකරගත යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් ලබාදී තිබුණු පාරිසරික ආරක්ෂණ බලපත්‍රවල වලංගු කාලය ඉකුත්වී තිබුණු බලපත්‍ර 06 ක් අලුත්කිරීමට කටයුතුකර නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2010 වර්ෂයේදී ආරම්භ කරන ලද තණමල්විල සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ආරම්භ කර වසර 12 ක් ගතවී තිබුණද, පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි. තවද එක්රැස්වන නොදිරන කසල වලකට බැහැර කරමින් පැවති අතර ප්‍රතිචක්‍රීකරණය කිරීමකට හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය බලපත්‍ර ගාස්තුව ගෙවා ඇති බවත් නොදිරණ කැළිකසළ එකතුවීම අවම කිරීම සඳහා සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ බෝතල් ගබඩා කිරීමට ස්ථානයක් ඉදිකර ඇති බවත් කාරුණිකව දන්වා සිටිමි. | සණඅපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව සිදුකළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් 15ක හා සුසාන භූමි 102ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී සභාවේ මූල්‍ය තත්වය මත ඉතිරි සුසාන භූමි හා ඉඩම්වල මැනුම් කටයුතු සිදු කර තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෘත්තීය තක්සේරුකරුවන් මගින් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව සභා බලප්‍රදේශයේ සංවර්ධන මට්ටම් සැලකිල්ලට ගෙන දියුණු කළ ප්‍රදේශ සම්බන්ධයෙන් වරිපනම් බදු ප්‍රකාශයට පත්කර ගාස්තු අයකර නොතිබුණි. | 2023 පෙබරවාරි 17 දිනැති ගැසට් පත්‍රය මගින් දියුණු කළ ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්කර ඇති අතර, තක්සේරු කටයුතු සඳහා විධිමත් සමීක්ෂණයක් ආරම්භ කර ඇති බව දන්වා සිටිමි. | දියුණු කළ ප්‍රදේශ සම්බන්ධයෙන් වරිපනම් බදු ප්‍රකාශයට පත්කර ගාස්තු අයකළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් වාහන 09 ක් සඳහා වර්ෂ කිහිපයක සිට ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබීම හේතුවෙන් දඩ මුදල් ලෙස රු.55,045 ක් සහ ගාස්තු වශයෙන් රු.155,600 ක් ගෙවිය යුතුව තිබුණි. | වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනිමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රමාදයකින් තොරව ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු වාහන 05 ක් 2023 මාර්තු 17 දින වන විටත් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණු අතර එම වාහන අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ අලුත්වැඩියා කළ නොහැකි රජ වාහන අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කිරීම සඳහා විශාල මුදලක් වැය වීම හා ඵලදායී නොවීම යන හේතු මත අලුත්වැඩියා නොකර ඇති අතර හැකියාවක් වෙතොත් ඉදිරියේදී මෙම වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිෂ්ක්‍රීය වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ විධිමත් අනුමැතියක් යටතේ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | තණමල්විල ප්‍රාදේශීය සභාව භාවිතා කරන වාහන 02 ක අයිතිය 2023 මාර්තු 17 දින වන විටත් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරන බව කාරුණිකව දන්වමි. | සභාව භාවිතා කරන වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන අරමුදල් යටතේ රු.1,971,438 ක් වැයකර දිමුතු පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සභාව විසින් 2022 ජුලි 08 දින ග්‍රාම සංවර්ධන සමිතියක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2022 ඔක්තෝබර් 08 දින වන විට එම ඉදිකිරීම් අවසන් කළ යුතුව තිබුණද 2022 නොවැම්බර් 18 දින සිදු කළ භෞතික පරික්ෂාවේදී එහි වැඩ අතරමඟ නවතා දමා තිබුණු අතර කොන්ත්‍රාත්කරුට කොටස් මුදල් වශයෙන් රු. 465,712 ක් ගෙවා තිබුණි. | කර්මාන්තය සම්පූර්ණයෙන්ම නිම කිරීමට කඩිනමින් කටයුතු කරන බව දන්වා සිටිමි. | අදාල කාල සීමාව තුළ ඉදිකිරීම් අවසන් නොකිරීම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(ii) මාර්ගෝපදේශයට අනුකූල නොවන ලෙස තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් අවස්ථා 03 කදී අනුමත සමිති වෙත රු. 1,199,247 ක් අත්තිකාරම් මුදල් ලෙස ලබාදී තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත්කාර සමිතිය විසින් අදාල කර්මාන්ත ඉටු කර නොතිබුණු අතර 2023 මාර්තු 17 දින වන විටත් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණු මුදල් සභාව විසින් අයකරගෙන නොතිබුණි. | මෙම අත්තිකාරම් මුදල විධිමත් පරිදි නැවත අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් 2022 මාර්තු අවස්ථා 02 කදී මාර්ග 02 ක් සංවර්ධනය කිරීම සඳහා රු. 70,000 බැගින්, රු. 140,000 ක අත්තිකාරම් මුදලක් අනුමත සමිතියක් වෙත ලබාදී තිබුණද 2023 මාර්තු 17 දින වන විටත් අදාල මාර්ග සංවර්ධනය කර නොතිබුණු අතර අත්තිකාරම් ලෙස ලබාදුන් මුදලද සභාව වෙත අයකරගෙන නොතිබුණි. | අදාළ මාර්ගයන්හි සිදු කරනු ලබන වැඩ කොටස් මත බිල් කිරීම් සිදු කර ලබාදී ඇති අත්තිකාරම් මුදල් අයකර ගැනීමටත්, යම් මුදල් අඩුවීමක් වෙනම් අදාළ සමිතිය මඟින් අයකර ගැනීමටත් කටයුතු කරනබව දන්වා සිටිමි. | අදාල කාල සීමාව තුල ඉදිකිරීම් අවසන්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(ii) මාර්ගෝපදේශයට අනුකූල නොවන අයුරින් තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් අවස්ථා 12 කදී කර්මාන්ත ඉටුකිරීම සඳහා අනුමත සමිති වෙත රු. 2,280,992 ක මුදලක් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි. | නොදැනුවත්භාවය නිසා පෙර වර්ෂවල සිටම කර්මාන්ත සඳහා අත්තිකාරම් ලබාදී ඇති අතර, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 04 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව සේවකයින් 10 දෙනෙකුගේ ඌනතාවයක් පැවති අතර 2023 මාර්තු 17 දිනවන විටත් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් සෑම මාසයකම අදාල බලධාරීන් දැනුවත් කිරීම සිදුකරනු ලැබේ. | කාර්ය මණ්ඩලයේ පුරප්පඩු පුරවාගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවේ සේවය කළ දෛනික වැටුප් ලබන සේවකයින් වෙනුවෙන් 2015 ඔක්තෝබර් සිට 2022 ඔක්තෝබර් දක්වා කාලයට අදාලව ගෙවිය යුතු රු.1,103,087 ක දායක මුදල් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවීම් කර නොතිබුණි. | හිඟ දායක මුදල් සහ අධිභාර මුදල් ගෙවීමට පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලැබී ඇති අතර වාරික වශයෙන් ගෙවීම සඳහා කළමනාකරණ කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලද පසු මෙම හිඟ මුදල වාරික වශයෙන් ගෙවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | සේවා නියුක්තිකයන් ගේ භාර අරමුදලට අදාල ගෙවීම් කාලීනව සිදු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම් හා වර්ෂයේ තථ්‍ය ආදායම් අතර සියයට 3 සිට සියයට 100 දක්වා ද, ඇස්තමේන්තු කළ වියදම් හා වර්ෂයේ තථ්‍ය වියදම් අතර සියයට 2 සිට සියයට 95 දක්වා සැලකිය යුතු විචලනයන් පවතින බැවින් ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | රට තුළ පැවති කොවිඩ් වසංගත තත්වය හා රටේ පැවති අහිතකර දේශපාලන වාතාවරණ හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇති වූ අතර 2023 වර්ෂයේදී විචලනයන් අවම වන පරිදි අයවැය ලේඛනය යොදාගැනීමට කටයුතු කරමි. | නිවැරදි අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුය. |